# සාරාංශය

හතරවන ශ්‍රේණියේ ඉගෙනුම් ලබන සිසුන්ගේ ගණිත විෂය සාධනයේ පවතින විෂමතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් නැමැති මාතෘකාව යටතේ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් කේන්ද්‍රයේ 2003 පර්යේෂණයේ දත්ත සමඟ මාතර අධ්‍යාපන කාලපයේ 1 C වර්ගයේ පාසල්වල 2009 වර්ෂයේ සාධන මට්ටම සැසඳීමක් තුළින් මෙම අධ්‍යනය සිදුකෙරේ.

මෙම අධ්‍යනයට පදනම් වු පොදු අරමුණු කිහිපයක් මෙසේ දක්විය හැකිය. මාතර දිස්ත්‍රික්කයේ පාසල් කිහිපයක සිසුන් නියැදියක් ලෙස යොදාගනිමින් කරනු ලැබු මෙම පර්යේෂණය තුළින් දෙවන ප්‍රධාන අවධිය සඳහා වු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳව සහ ගණිත විෂය ප්‍රවීණතාව පිළිබඳව අධ්‍යනය කිරිම එක් අරමුණකි එම නිපුණතා වර්ධනය වීම කෙරෙහි බලපානු ලබන ගුරුවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, ගුරු පුහුණුව ඉගැන්වීම් පළපුරුද්ද, ඉගෙනුම් ද්‍රව්‍ය, පන්ති කාමර අධීක්ෂණය යන ආදි සාධකද පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් සහ තක්සේරුකරණ ක්‍රියාවලිය සාර්ථකවීමට පාසල තුළ ඇති සම්පත් යන සාධකයන් ද කුමන ආකාරයේ දායකත්වයක් ලබාදෙන්නේ ද යන්න සොයා බැලීම තවත් අරමුණක් විය.

ඉදිරි ආනගතයේදි ගණිත සාධනය ඉහළ නැංවීමට ජාතික මට්ටමේ යම් ව්‍යාපෘතියක් සකස් කරන්නේ නම් ඒ පිළිබඳව සුදුසු යෝජනා හා අදහස් ඉදිරිපත් කිරිම අරමුණු වේ.

මෙහි පළමුවන පරිච්ජේදය තුළින්  අධ්‍යයන ගැටලුව පිළිබඳවත් එහි වැදගත්කම පිළිබඳවත් කෙටි හැඳින්වීමක් කරන ලදී.

දෙවන පරිච්ජේදය තුළින් මෙම පර්යේෂණයට වැදගත්වන පූර්ව සාහිත්‍ය විමර්ශනය සිදුකරන ලදී. තුන්වන පරිච්ජේදය තුළින් සිදුවන්නේ පර්යේෂණයට අදාළ ක්‍රම ශිල්ප පිළිබඳ ඉදිරිපත් කිරිමයි මේ අනුව නියැදිය තෝරාගත් ආකාරය, දත්ත විශ්ලේෂණය කළ අයුරු පිළිබඳව මෙම පරිච්ජේදය තුළින් විස්තර වේ.

හතරවන පරිච්ජේදයේදි තොරාගත් පාසල් 05 හි හතර ශ්‍රේණියේ වර්තමාන තත්ත්වය පරිකෂා කරනු ලබන අතර 2003 නෙරෙක් අධ්‍යයනයේ පසු පරික්ෂණයක් ලෙස මෙය සිදුකරන ලදි.

දත්ත ඉදිරිපත් කිරිම, දත්ත විශ්ලේෂණය හතරවන පරිච්ජේදයේදි සිදුකරන ලදි. විෂය නිර්දේශ, සාධන පරිකෂණය ශිෂ්‍ය, ගුරු, අංශ ප්‍රධාන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ආදිය මගින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කර ඉදිරිපත් කිරිම මෙම පරිච්ජේදයේදී සිදුකරන ලදී

පස්වන පරිච්ජේදයේදි දත්ත විශ්ලේෂණය තුළින් එළඹි නිගමන හා ගණිත විෂය සංවර්ධනයට අදාළ යෝජනා ඉදිරිපත් කරන ලදි.

සමස්තයක් ලෙස ගත් කල මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වුයේ සිසුන් තුළ ගණිතය සාධනයේ පවතින විෂමතා පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරිමයි.